ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. SGLG/RT/A/BLUC/FA/05/2022/15 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2023 අප්‍රේල් 17 දින.

ලේකම්,

බලංගොඩ නගර සභාව.

බලංගොඩ නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(I) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ටී.පී.එම්. කුමානායක,

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,

විගණකාධිපති වෙනුවට.

පිටපත :- පළාත් පාලන කොමසාරිස්, සබරගමුව පළාත් සභාව - කා.දැ.පි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. SGLG/RT/A/BLUC/FA/05/2022/15 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2023 අප්‍රේල් 17 දින.

ලේකම්,

බලංගොඩ නගර සභාව.

**බලංගොඩ නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(I) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

බලංගොඩ නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට බලංගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළ උපචිත වියදම් රු.1,315,430ක් ගිණුම්ගතකර නොතිබීමෙන් මෙහෙයුම් වියදම හා ජංගම වගකීම් එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි.

(ආ) එකතුව රු.504,274,940ක් වූ ගිණුම් විෂයයන් 04ක වටිනාකම් සහිත විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ඇ) වර්ෂය අවසාන දිනට පැවති කොම්පෝස්ට් තොගයේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 5.6 වගන්තිය | සභාව සතු රජයේ නිවාස 05ක ආර්ථික කුලිය 2010 වර්ෂයෙන් පසු නැවත තක්සේරු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 110 | හානි පිළිබඳ ලේඛනයක් සකස්කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371(5) | පරිගණක මෘදුකාංගයක් (WEB Base System) සැපයීම සඳහා 2020 ඔක්තෝබර් 14 දින ලබා දී තිබුණු වටිනාකම රු.50,000ක් වූ අත්තිකාරම පියවා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2021 සැප්තැම්බර් 29 දින අංක 01/2021 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.5 වගන්තිය | එකතුව රු.6,841,637ක් වූ කර්මාන්ත 10ක් ඒවා අයත් බල ප්‍රදේශයෙන් බැහැර ප්‍රජා පාදක සංවිධානවලට පිරිනමා තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,227,487ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,063,975ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 10,777,000 | 11,611,507 | 12,335,139 | 6,156,320 | 10,700,000 | 11,951,860 | 8,429,144 | 6,874,552 |
| කුලී | 36,096,000 | 35,675,467 | 34,481,551 | 860,427 | 38,729,000 | 29,003,597 | 31,208,785 | 1,551,806 |
| බලපත්‍ර ගාස්තු | 2,285,000 | 1,534,728 | 1,379,728 | - | 2,223,000 | 1,503,965 | 1,452,216 | - |
| වෙනත් ආදායම් | 27,030,000 | 24,701,612 | 24,957,583 | - | 22,143,000 | 20,990,067 | 18,375,765 | - |
| | 76,188,000 | 73,523,314 | 73,154,001 | 7,016,747 | 73,795,000 | 63,449,489 | 59,465,910 | 8,426,358 |

සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ ආදායම රු.8,426,358ක් වූ අතර, වර්ෂයේ බිල්කිරීම රු.73,523,314ක් විය. ඒ අනුව වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු.81,949,672ක් වුවද, රැස් කරන ලද ආදායම රු. 73,154,001ක් වීමෙන් තවදුරටත් රැස්කර ගතයුතු ආදායම සමස්ථ ආදායමේ ප්‍රතිශතයක් ලෙස සියයට 11ක මට්ටමක පැවැතිණි.

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

---------------------------------------

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කළ ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් හා බදු, වරෙන්තු හා දඩ සහ වෙනත් ආදායම් යන ආදායම් විෂයයන්ගෙන් රැස්කළ ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 14කින්, 63කින් හා 203කින් වැඩි වී තිබුණු අතර, බලපත්‍ර ගාස්තු යන ආදායම් විෂයයේ රැස්කළ ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා සියයට 33කින් අඩු වී තිබුණි.

2.2.3 වරිපනම් හා බදු

-----------------

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂවලට අදාළ හිඟ වරිපනම් හා බදු රු.6,156,320ක් අයකරගෙන නොතිබුණු අතර, ඊට අදාළ කාල විශ්ලේෂණයක් ද සකස් කර නොතිබුණි. එමෙන්ම හිඟ ශේෂ අයකර ගැනීම සඳහා නගර සභා ආඥා පනතේ 170 වගන්තිය ප්‍රකාරව සභාව කටයුතු කර නොතිබුණි.

2.2.4 කුලී ආදායම්

--------------

ඉකුත් වර්ෂවලට අදාළ හිඟ කුලී ආදායම් රු.279,809ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අයකරගෙන නොතිබුණි.

2.2.5 බලපත්‍ර ගාස්තු

--------------

ප්‍රදර්ශිත දැන්වීම් පුවරු පිළිබඳ සමීක්ෂණයක් සමාලෝචිත වර්ෂය තුළ සිදුකර නොතිබීම නිසා තාවකාලික දැන්වීම් පුවරුවලින් ලැබිය යුතු ආදායම හඳුනාගත නොහැකි වී තිබුණි. එමෙන්ම, එක් දැන්වීම් පුවරුවක් වෙනුවෙන් රු.346,560ක් අඩුවෙන් අයකරගෙන තිබුණි.

2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.108,502ක් විය.

2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

2021 දෙසැම්බර් 03 දිනැති අංක 2257 දරන ගැසට් නිවේදනය පරිදි, විනෝද කටයුතු වෙනුවෙන් නිකුත් කරන රු.100ට වැඩි ටිකට්පතකින් සියයට 25ක් විනෝද බදු ලෙස අයකර ගත යුතු ය. එහෙත්, ටිකට්පත්වල වටිනාකම නොසලකා දින 10ක සැණකෙළියකින් විනෝද බදු ලෙස රු.500,000ක් පමණක් අයකර තිබුණි. එමෙන්ම, ක්‍රීඩාපිටිය හා ක්‍රීඩාගාරය සඳහා එම ගැසට් නිවේදනයට අනුකූලව ගාස්තු අය නොකිරීම නිසා රු.200,000ක ආදායමක් ද අහිමි වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 මානව සම්පත් කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත

(i) සභාවේ සේවා මට්ටම් තුනකට අයත් තනතුරු 60ක් පුරප්පාඩුව පැවතුණු අතර, සංවර්ධන නිළධාරි තනතුරු 08ක අතිරික්තයක් පැවැතිණි.

(ii) ගිනි නිවීමේ ඒකකය සඳහා අනුමත කළ තනතුරු 20ක් වෙනුවෙන් බඳවා ගැනීම් සිදුකර නොතිබීම නිසා ගිනි නිවීමේ ඒකකය විධිමත්ව ස්ථාපිත වී නොතිබුණි.

(ආ) සේවක ණය

2018 වර්ෂයේ සේවය හැර ගිය සේවකයෙකුගෙන් හිඟහිටි රු.76,114ක් අයකර නොතිබුණි.

3.2 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

---

සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 06ක දී සභිකයින් දෙදෙනෙකු හා නිලධාරිනියක විසින් රාජකාරීමය නොවන ගමන් සඳහා රු.42,576ක ඉන්ධන වැය කරමින් සභාවේ වැන් රථයක් භාවිතා කර තිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

---

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පවරා නොගත් වත්කම්

---

නගර සභා කාර්යාලය, සභා ආයුර්වේදය, කියවීම් ශාලාව, මහජන ක්‍රීඩාපිටිය හා ප්‍රේක්ෂකාගාරය පිහිටි ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) නිරවුල් කර නොගත් වත්කම්

---

සභාව සතු බවට ලේඛනවල සඳහන් වන අක්කර 05 පර්චස් 35.44ක් වූ ඉඩම් භෞතික වශයෙන් හඳුනාගෙන නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

---

(i) ක්‍රීඩා පිටියක් සඳහා 2020 පෙබරවාරි 18 දින රු.257,500කට මිලට ගන්නා ලද බල්බ් 50ක් හා 2019 හා 2020 වර්ෂවල දී ලද රු.128,375ක විදුලි උපාංග මේ දක්වාම අභාවිතව පැවැතුණි.

(ii) 2015 වර්ෂයේ දී ලද වටිනාකම සොයාගත නොහැකි කම්පැක්ටරයක් සහ ලද දිනය හා වටිනාකම සොයාගත නොහැකි ගලි ටැංකියක් වසර 05කට වැඩි කාලයක සිට අභාවිතව දිරාපත් වෙමින් පැවතුණි.

(ඇ) වාහන උපයෝජනය

සභාව සතු නොවූ වාහන 06ක හිමිකාරිත්වය, 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයෙහි 2(i) ඡේදය පරිදි පවරා ගැනීමට හෝ ආපසු භාර දීමට හෝ කටයුතු කර නොතිබුණි.

3.4 අවිධිමත් ගනුදෙනු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2019 වර්ෂයේ දී ගෝන මස් කිලෝග්‍රෑම් 10ක් ලඟ තබා ගැනීම හා 2022 වර්ෂයේ දී බ්‍රැන්ඩි ලීටර් 2.250ක් ගිණුම් ගත නොකිරීම යන කරුණු මත අධිකරණය විසින් රු.125,000ක දඩයක් බලංගොඩ තානායම් පාලකට නියම කර තිබුණි. එකඟ වූ ගිවිසුම අනුව, නීතිවිරෝධි ක්‍රියාවක් කළහොත් බදු අයිතිය අහෝසි විය යුතු වුවද, 2023 වර්ෂය සඳහා ද ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව එම බදුකරුටම තානායම බදු දී තිබුණි.

(ආ) සභාවේ සැලසුම් කමිටු තීරණවලට හා 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතට පටහැනිව, සභාපතිවරයාගේ අභිමතය පරිදි අනවසර ගොඩනැගිලි 02ක් සඳහා සැලසුම් අනුමත කර අනුකූලතා සහතික නිකුත් කර තිබුණි. එම අනුමැතිය ලබාදීමේ දී , නගර සභා ආඥා පනතේ 171 වගන්තියෙන් ලබා දී ඇති බලතල ඉක්මවා සභාවට අයකර ගත යුතු ආදායම් රු.886,301ක් ද අත්හැර දමා තිබුණි.

3.5 හඳුනාගත් පාඩු

ජාතික වෙසක් උත්සවය නිමිත්තෙන් බලංගොඩ නගරය විදුලි ආලෝකකරණය සඳහා ගත් තීරණය පසුව අවලංගු කර තිබුණි. තීරණය දැනුම් දීමට ප්‍රමාද වීමත්, ඒ අතරතුර එම කාර්යය සඳහා කාර්ය මණ්ඩලයක් බලංගොඩ නගරයට පැමිණීමත් නිසා අදාළ කාර්යය ඉටු නොකළද, ඔවුන්ගේ යැපීම් වෙනුවෙන් රු.75,000ක් ගෙවීමට සභාවට සිදු වී තිබුණි.

ටී.පී.එම්. කුමානායක.

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,

විගණකාධිපති වෙනුවට.